ශීර්ෂය 312- බස්නාහිර පළාත් සභාව

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

1.1 මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැලසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදා කිරීම.

(ආ) ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පළාත් සභාව වෙත පැවරී ඇති කාර්යයන් සම්බන්ධයෙන් පරිපාලනමය කටයුතු ඉටු කිරීම.

2 ගිණුම්

2.1 විසර්ජන ගිණුම්

මුළු ප්‍රතිපාදනය හා වියදම

පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.12,057,251,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.9,691,181,000 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.2,366,070,000 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19.62 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 9,011,251,000 | 9,240,251,000 | 8,893,771,000 | 346,480,000 | 3.75 |
| මූලධන | 2,417,000,000 | 2,817,000,000 | 797,410,000 | 2,019,590,000 | 71.69 |
| එකතුව | 11,428,251,000 | 12,057,251,000 | 9,691,181,000 | 2,366,070,000 | 19.62 |